www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යංශය පොලිස් රාජ්‍ය ක්‍රියාකාරකම් පුළුල් කරයි

**Sri Lankan defence ministry extends police state moves**

**කේ. රත්නායක විසිනි**
**2007 මාර්තු 19**

ශ්‍රී ලංකාවේ ආන්ඩුව දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් පුළුල් කරන තතු තුළ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් තව දුරටත් සීමා කිරීමේත් දේශපාලන විරුද්ධත්වය, විශේෂයෙන් ම යුද්ධයට දක්වන විරුද්ධත්වය, මැඩීමේත් පියවර සූදානම් කෙරෙමින් පවතී.

මාර්තු 1 දා ආරක්ෂක අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද භයංකර ප්‍රවෘත්ති නිවේදනයක්, ආරක්ෂක හමුදාවල ක්‍රියාකාරකම් විවේචනය කරන ඕනෑම අයෙකුට එරෙහිව වත්මන් හදිසි නීති බලතල වඩා පුළුල් ලෙස යොදා ගැනීමක් ගැන කල් තියා අනතුරු ඇඟවී ය. අර්ථභාරී ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යවරයා ද වන අතර එනයින් ගත් කල එම නිවේදනය සම්බන්ධයෙන් සෘජුව ම වගකීම දරයි. ඔහුගේ සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යංශයේ ඉහළ ම පරිපාලන තනතුර හොබවයි.

"ආරක්ෂක අමාත්‍යංශයට මාධ්‍ය නිදහස මර්දනය කිරීමේ කිසිදු අභිප්‍රායක් නැත" යන මැයෙන් යුතු නිවේදනයේ අභිප්‍රාය වූයේ මාධ්‍යවේදීන් ඇතුලු පුද්ගලයන් සිය ගනනක් නඩු විභාගවලින් තොරව හිතුවක්කාරී ලෙස රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හා ජාත්‍යන්තරව වැඩෙන විවේචන අපගමනය කිරීම යි. අත් අඩංගුවට ගැනීම් සිදු කෙරී ඇත්තේ, 2002 සටන් විරාමය අත්සන් කිරීමෙන් පසුව අහෝසි කෙරුනු එහෙත් පසු ගිය දෙසැම්බරයේ දී යළි බලාත්මක කෙරුනු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීටීඒ) නම් වූ රටේ කුප්‍රකට පනතේ ම වඩා පුළුල් රූපාකාරයක් යටතේ ය.

රඳවා ගැනීම් සිදුව ඇත්තේ, දිවයිනේ උතුරේ හා නැගෙනහිර යුද කලාප තුළ මෙන් ම කොළඹ අගනුවර ද සිදු කෙරෙන ඝාතන හා පැහැර ගැනීම් රැල්ලක් මධ්‍යයේ ය. මිලිටරියේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන ඝාතක කල්ලි යැයි පුළුල් ලෙස විශ්වාස කෙරෙන කන්ඩායම්වල ඉලක්ක බවට පත් වූවන් අතර මාධ්‍යවේදීන් හා සෙසු මාධ්‍ය සේවකයෝ ද සිටිති. අත් අඩංගුවට ගැනීම් හා ඝාතන පුළුල්ව පැතිරුනු වෛරයක් හා විරෝධයක් අවුලුවා තිබේ.

මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් මොන යම් හෝ සහතිකයක් දෙනවා වෙනුවට ආරක්ෂක අමාත්‍යංශය, "ජාතික ආරක්ෂාවට තර්ජනය කරන ක්‍රියාකාරකම්වල සෘජුව හෝ වක්‍රව යෙදෙන ඕනෑම පුද්ගලයකු පවත්නා නීතියේ රාමුව තුළ අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමට නීතිය බලාත්මක කරන බලධාරීන්ට" ඇති අයිතිය නිර්භීත ලෙස අවධාරනය කරයි. රඳවා ගැනීම් යුක්තියුක්ත කරමින් එය තව දුරටත් මෙසේ කියා සිටී: "ජාතික ආරක්ෂාවට තර්ජනය කිරීමට ක්‍රියා කර ඇති මාධ්‍යවේදීන්, ආරක්ෂක හමුදා සාමාජිකයන් හා සිවිල් වැසියන් අත් අඩංගුවට ගැනීම පෙර පැවති රජයන් යටතේ පවා සිදු වී තිබේ."

ආරක්ෂක හමුදාවන් මීට පෙර මාධ්‍යවේදීන් අත් අඩංගුවට ගෙන ඇත යන්න නිසැක ය. 1998 දී පොදු පෙරමුනු ආන්ඩුව යටතේ දෙමළ මාධ්‍යවේදීන් දෙදෙනෙක් පිලිවෙලින් මාස දෙකක් හා මාසයක් රඳවා තබා ගැනුනි. කෙසේ වෙතත්, එම අවස්ථාවේ දී එල්ටීටීඊය සමග විවෘත යුද තත්වයක් පැවතුනි. වත්මන් අත් අඩංගුවට ගැනීම් රැල්ල අවධාරනය කරන්නේ, 2002 සටන් විරාමයට බැඳී සිටින බවට එය කරන සියලුම කියාපෑම් තිබිය දී ම, රාජපක්ෂ ආන්ඩුව දිවයින යලිත් වරක් යුද්ධයට ඇද දමා එයට එරෙහි මොන යම් හෝ විරුද්ධත්වයක් තලා දැමීමට උත්සාහ කරන බව යි.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳ පැහැදිලි නිදසුනක් නම් පසු ගිය වසරේ නොවැම්බර් 13 දා අත් අඩංගුවට ගත් දෙමළ මාධ්‍යවේදිනියක වන පරමේෂ්වරී මුන්නුසාමි රඳවා තබා ගැනීම යි. ජනවාරි 23 දා උසාවිය පීටීඒ යටතේ ඇය තවත් දින 90කට රඳවා තබා ගැනීම පිනිස පොලීසිය කර ඉල්ලීමකට අවසර දුන්නේ ය. කිසිදු චෝදනාවකින් හෝ අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කිසිදු හේතු දැක්වීමකින් තොරව ඇය මාස හතරකටත් වැඩි කාලයක් තිස්සේ රඳවා ගෙන සිටී.

"පවත්නා නීතියේ රාමුව තුළ" යොදා ගත හැකි පොලිස් රාජ්‍ය විධික්‍රම මේවා ය. "ජාතික ආරක්ෂාවේ" නාමයෙන්, සුලු සාක්ෂ්‍ය මත නැති නම් කිසිදු සාක්ෂ්‍යයකින් තොරව ගොතන ලද සිද්ධීන් මත පදනම්ව මාධ්‍යවේදීන් ඇතුලු පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට හා රඳවා ගැනීමට මිලිටරියට හා පොලීසියට පුලුල් බලතල පවතී. 2002 සටන් විරාමයට පෙරාතුව, දස දහස් ගනන් ජනයා, විශාල වසයෙන් දෙමල ජනයා, චෝදනාවලින් තොරව මාස ගනන් හෝ වසර ගනන් රඳවා තබා ගැනුනි. සමහර අවස්ථාවන්හි දී, පුද්ගලයන් වධ බන්ධනයට ලක් කොට ඔවුන්ගෙන් ලබා ගන්නා "පාපොච්චාරන" ඔවුන් වැරදිකරුවන් කරනු පිනිස යොදා ගන්නා ලදි.

එවන් විධික්‍රම "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ" 1978 ආන්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුල විස්තර කෙරෙන මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් පැහැදිලිව ම උල්ලංඝනය කිරීමකි. එම ව්‍යවස්ථාවේ වධ හිංසාවලින් නිදහස, අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් නිදහස, භාෂනයේ නිදහස, සාමකාමී රැස්වීමේ නිදහස සහ වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් යමකු නිර්දෝෂී යයි පූර්වානුමාන කිරීම යනාදි සියල්ල ම ලැයිස්තුගත කොට ඒවා විස්තර කර ඇත. ආන්ඩුව හා මිලිටරිය පදනම් වන්නේ "මූලික අයිතිවාසිකම් පිලිබඳ සීමා" යන මැයෙන් වූ ආන්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව මත ය. ශ්‍රී ලංකාව "සමාජවාදී" නොවන තරමට ම "ප්‍රජාතාන්ත්‍රික" ද නොවන බව එම වගන්තියෙන් පැහැදිලි වේ.

15 වන ව්‍යවස්ථාවේ 7 වන අනු ව්‍යවස්ථාව මෙසේ සඳහන් කරයිඃ "12 වන ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනු ව්‍යවස්ථාවලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිලිගෙන ඇති සියලු ම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත් ම ද තහවුරු කිරීම පිනිසත් මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිනිසත් අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිලිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිනිසත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභ සාධනය සඳහා යුක්තිසහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිනිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම්වලට යටත්ව ය." වෙනත් වචනවලින් කිය තොත්, මාධ්‍යවල අයිතීන් ද ඇතුලු මූලික ප්‍රජාතන්ත්‍ර හා නෛතික අයිතිවාසිකම් සෑම එකකට ම පාහේ රුදුරු සීමා කිරීම් පැනවීමේ නිර්බාධිත බලතල ආන්ඩුව සතුව පවතී.

ප්‍රායෝගිකව ගත් කල, ප්‍රජාතන්ත්‍ර අයිතීන් විවෘතව ම උල්ලංඝනය කිරීමට ආන්ඩුවට හා ආරක්ෂක හමුදාවන්ට පවත්නා හැකියාව දේශපාලනික සලකා බැලීම්වලට යටත් කෙරී ඇත. එනම් සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ විරුද්ධත්වය හා විරෝධතා සම්බන්ධයෙනි. මෑත ආරක්ෂක අමාත්‍යංශ නිවේදනයේ වඩාත් ම අර්ථභාරී අංගය නම් එය ද එවන් උද්ඝෝෂන ඉලක්ක කර ගැනීම යි. හිතුවක්කාරී අත් අඩංගුවට ගැනීම්වල නීතියුක්ත භාවය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එය මෙසේ කියා සිටීඃ "පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව දියත් කෙරෙන විරෝධතා හා බලපෑම් දැමීම් පරීක්ෂනවලට බාධා කරනවා පමනක් නොව ආන්ඩුවේ ස්ථාවරත්වයට ද තර්ජනය කරයි."

"ආන්ඩුවේ ස්ථාවරත්වයට" තර්ජනය කරන ඕනෑම අයකු හෝ ඕනෑම සංවිධානයක් සම්බන්ධයෙන් "ජාතික ආරක්ෂාවේ" කඩතුරාව යොදා ගැනීම දක්වා යාමට මිලිටරිය සූදානම් වන බවට මෙම ප්‍රකාශය පැහැදිලි තර්ජනයකි. එම ප්‍රකාශය අත් අඩංගුවට ගැනීම්වලට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීමට එරෙහිව විරෝධය දක්වන අය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කරන නමුදු, ඕනෑම ආකාරයක පොදු විවේචනයක් හෝ දේශපාලන විරුද්ධත්වයක් නීති විරෝධී ලෙස ප්‍රකාශ කරනු පිනිස එම තර්කය ම යොදා ගත හැකි ය.

රාජපක්ෂ වාරු වී සිටින්නේ යුද්ධයට හා ජීවන මට්ටම්වල පිරිහීමට එරෙහිව වැඩෙන මහජන විරුද්ධත්වයකට මුහුන දී සිටින හෙලත්තාඩු සභාගයක් මත ය. පසු ගිය මාස හයක කාලය තිස්සේ, රැකියා, වැටුප් හා සේවා කොන්දේසි අරබයා කම්කරුවන්ගෙන් වර්ජන හා විරෝධතා මාලාවක් ම දැනටමත් පැන නැග ඇති අතර ඒවා මගින් ආන්ඩුව දරුනු ලෙස සොලවාලනු ලැබ ඇත. පසු ගිය දෙසැම්බරයේ දී ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යලි පනවන විට, "ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවාවන් පවත්වා ගෙන යාමට බාධා කිරීම හෝ තර්ජනය කිරීම" නීති විරෝධී කිරීම දක්වා එහි භාවිතය පුලුල් කිරීමට රාජපක්ෂ කටයුතු කිරීම අර්ථභාරී ය.

පැන නැගී ඇති විරුද්ධත්වයට රාජපක්ෂගේ ප්‍රතිචාරය වී ඇත්තේ වර්ගවාදී සතුරුකම් අවුලුවාලීම හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාර ගැඹුරු කිරීම යි. වරායේ හා වතුකරයේ වර්ජක කම්කරුවන් "ත්‍රස්තවාදයට" උදව්කරන්නන් ලෙස ඔහු චෝදනා කර තිබේ. පෙබරවාරි මස මුල දී, මිලිටරිය දුම්රිය කම්කරු එකතුව දෙමසකට වරක් පල කරන අකුන පුවත්පතට සම්බන්ධිත වාමාංශිකයන් තිදෙනෙකු අත් අඩංගුවට ගත්තේ ය. එල්ටීටීඊය සමග සහයෝගීව ක්‍රියා කල බවට ඔවුන් කර ඇතැයි කියන පාපොච්චාරන ගසා කමින්, නඩු විභාගයකින් තොරව දැනට රඳවා ගෙන සිටින අනේක පුද්ගලයන් පිලිබඳ එල්ල විය හැකි මොන යම් හෝ විවේචනයක් නිහඬ කිරීමේ උත්සාහයක ආන්ඩුව යෙදී සිටී.

පසු ගිය බදාදා කල අදහස් දැක්වීමක දී, රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යංශ ප්‍රකාශයේ අඩංගු වූ අනතුරු ඇඟවීම ප්‍රතිරාවය කලේ ය. තමන් විවිධාකාර දේශපාලන ‘කුමන්ත්‍රනවලට’ මුහුන දී සිටින බවත් එක අතකින් එල්ටීටීඊයට එරෙහි යුද්ධය ගෙන යාමට ද අනෙක් අතින් ආර්ථික සංවර්ධනයට මුල පිරීමට ද ‘ස්ථාවර ආන්ඩුවක්’ අවශ්‍ය බවත් ඔහු මාධ්‍යවලට පැවසී ය. ‘මව්බිම පාවා දීමට මම සූදානම් නැත’ යැයි ඔහු අවධාරනාත්මකව ප්‍රකාශ කලේ ය.

කම්කරු පන්තිය මෙම ප්‍රකාශවලින් තියුනුම අනතුරු ඇඟවීම් ගත යුතු ය. මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් සීමා කිරීමට කඩතුරාව ලෙස ‘ස්ථවාර ආන්ඩුවක්’ අවශ්‍යතාව මතු කිරීම සියලු ම ආකාරයේ දේශපාලන විරුද්ධත්වයන් නීති විරෝධී කිරීමට ආඥාදායකයන් හා පොලිස් රාජ්‍ය විසින් යොදා ගෙන ඇති යුක්තිකරනයකි.

© www.wsws.org